# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1643/35 - 2010 මාර්තු 04 වැනි බ්‍රහස්පතින්දා - 2010.03.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස — ඉඩම්

## ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් සංවර්ධන ආඥාපනත

1969 අංක 16 දරන පනතින් සහ 1981 සහ අංක 27, 1993 අංක 22, 1995 අංක 09, 1996 අංක 20 දරන සංශෝධිත පනත්වලින් සංශෝධිත (464 අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 සහ 156 වැනි වගන්ති යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන ජනාවාස හා රණවිරු සුභසාධන අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ එකී පනතේ 157 වැනි වගන්තිය යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද රෙගුලාසි.

ජොන්ස්ටන් ප්‍රනාන්දු,
ඉඩම් හා ඉඩම් සංවර්ධන, ජනාවාස
සහ රණවිරු සුභසාධන අමාත්‍ය.

2010 පෙබරවාරි මස 10 වැනි දින,
අංක 80/5, ගොවිජන මන්දිරය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1. මෙම රෙගුලාසි 2010 ඉඩම් සංවර්ධන රෙගුලාසි වශයෙන් හඳුන්වනු ලැබේ.
2. 1981 නොවැම්බර් මස 26 වැනි දින සාදනු ලැබූ අංක LD/B/167/34 (II) දරන ඉඩම් සංවර්ධන රෙගුලාසි පහත ආකාරයට සංශෝධනය කරනු ලැබේ.
3. 1981, ඉඩම් සංවර්ධන රෙගුලාසි 14 : 2 (ii) අ, ආ, ඇ, ඈ, ඡේද වෙනුවට පහත ඡේද ආදේශ කිරීමෙන් එනම්

| | *බිම් කට්ටියේ ප්‍රමාණය අක්කර 10ක් හෝ ඊට අඩු වූ විට* *රු. ශත.* | *බිම් කට්ටියේ ප්‍රමාණය අක්කර 10ක් හෝ ඊට වැඩි වූ විට* *රු. ශත.* |
|---|---|---|
| (අ) නියමිත කාල සීමාවට පසුව ඉදිරිපත් කරන ලද නම් කිරීමක් සඳහා | 25.00 | 125.00 |
| (ආ) නම් කිරීමක් අවලංගු කිරීම සඳහා | 25.00 | 125.00 |
| (ඇ) දෙවන හෝ අනතුරුව කෙරෙන යම් නම් කිරීමක් සඳහා | 100.00 | 100.00 |
| (ඈ) අවලංගු කිරීමක් සඳහා සහ ඒ ලේඛනයෙන්ම ඉදිරිපත් කරන ලද දෙවන හෝ ඉන් අනතුරුව කෙරෙන නම් කිරීමක් සඳහා | 100.00 | 100.00 |

03-671

1A - G 12557— 730 (2010/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.